// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2305/16 - 2022 නොවැම්බර් මස 09 වැනි බදාදා - 2022.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 21/78 (XV) (සී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මඟින්, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) 2005 ජුනි මස 1 වන දින අංක 1395/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය" යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "2. අපනයන කෘෂිකර්ම අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"3. ආහාර විද්‍යාව සහ තාක්ෂණ අධ්‍යයන අංශය.".

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0079

1A - PG 6031 — 457 (2022/11)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.